නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

நேஷனல் பேப்பர் கம்பெனி லிமிடட்

National Paper Company Limited



NPCL

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கைகள்

Annual Report

2014 - 2015

කර්මාන්ත අමාත්‍යාංශය

தொழில்துறை அமைச்சகம்

Ministry of Industries

වාර්ෂික වාර්තා, ගිණුම් ප්‍රකාශණ සහ ස්වාධීන විගණන වාර්තා

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

වාර්ෂික වාර්තාව

2015.03.31 දිනෙන් අවසන් වන වසර සඳහා

INDEX

අන්තර්ගතය **පිටු අංක**

1. සභාපතිතුමාගේ පණිවුඩය 01

2. වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය 2022 03

3. දැක්ම සහ මෙහෙවර 05

4. 2015.03.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
   4.1 සංස්ථාපිත තොරතුරු 09
   4.2 අධ්‍යක්ෂවරුන්ගේ වාර්ථාව 10
   4.3 විගණකවරුන්ගේ වාර්ථාව සහ මූල්‍ය ප්‍රකාශන 11

உள்ளடக்கம் **பக்க இல.**

1. தலைவரின் செய்தி 01

2. பணிப்பாளர் குழாத்தினர் 2022 03

3. இலக்கு மற்றும் நோக்கக் கூற்று 05

4. 2015 மார்ச் 31 உடன் முடிவடையும் வருடத்துக்கான நிதிக் கூற்றுக்கள் பொருளடக்கம்
   4.1 கூட்டிணைக்கப்பட்ட தகவல்கள் 09
   4.2 பணிப்பாளர்களின் அறிக்கை 10
   4.3 கணக்காய்வாளர்களின் அறிக்கை மற்றும் நிதிக் கூற்றுக்கள் 11

Contents **Page No.**

1. Message from the Chairman 01

2. Incumbent Board of Directors 2022 03

3. Vision & Mission 05

4. Financial Statements for the Year Ended 31 March 2015
   4.1 Corporate information 09
   4.2 Report from the Directors 10
   4.3 Auditors' Report and Financial Statements 11



සභාපතිතුමාගේ පණිවුඩය

සීමාසහිත ජාතික කඩදාසි සමාගම නමින් ශ්‍රී ලංකාවේ කඩදාසි කර්මාන්තයේ නියමුවා ලෙස විරුදාවලිය ලත්, 1956 වසරේ සිට වර්තමානය දක්වා දශක 7 කට ආසන්න කාලයක් ජාතික කඩදාසි අවශ්‍යතාවය සපුරාලමින් ඉතා විශාල මෙහෙයක් ඉටු කරනු ලැබූ මෙම ආයතනය 1992 වසරේ රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද අතර 1995 සහ 1996 යන වසර වල ජාතික ඵලදායීතා සම්මානයෙන් පිදුම් ලද ආයතනයකි.

මා ඇතුළු වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය 2020 පෙබරවාරි මස සිට ජාතික කඩදාසි සමාගමේ පාලනාධිකාරිය වශයෙන් පත් කෙරෙන විට වාලව්චේන සහ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් දිවිත්වයම සම්පූර්ණයෙන්ම අකර්මණ්‍යව පැවතුණු අතර 2016 වසරේ ක්‍රියාත්මක වූ ස්වෙච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය හරහා ඉතා සීමිත සේවක පිරිසක් හැර ඉතිරි සියළු සේවකයින් විශ්‍රාම ගෙන තිබුණි. මෙසේ දේශයේ කඩදාසි කර්මාන්තය පසුබෑමට ලක්ව ඇති මොහොතක කඩදාසි වෙළඳ පොළ තුල නැවත ස්වයං මූල්‍යනයක් යටතේ ජාතික කඩදාසි සමාගම ස්ථානගත කිරීම සඳහා මාහට පැවරුණු අභියෝගය සතුටින් භාරගත් බව සිහිපත් කරමි.

මේ වන විට ජාතික කඩදාසි සමාගමේ 2012 අප්‍රේල් සිට 2015 මාර්තු මස දක්වා විගණිත මූල්‍ය ප්‍රකාශන පැවතියද ඒවා වාර්ෂික වාර්ථා ලෙස සකස් කර ඉදිරිපත් නොවී තිබීමද 2015 අප්‍රේල් මස සිට වාර්ෂික ගිණුම් සකස් කර නොතිබීමද අප ලද තවත් අභියෝගයක් වූ අතර 2020 වර්ෂයේ සිට වාර්ෂික අවසාන ගිණුම් සහ වාර්ෂික වාර්ථා ක්‍රමානුකූලව නිසි පරිදි සකස් කල යුතු බැවින් පසුගිය දත්ත මත පදනම්ව ඉතාමත් කෙටි කලක් ඇතුලත 2012 - 2015 වර්ෂයන්හි වාර්ෂික වාර්ථා සකස් කොට මෙසේ ඉදිරිපත් කිරීම, මාගේ ධුර කාලය තුල මා භාර ගත් අවිනිශ්චිත වගකීමක් වන අතර අප සතුව තිබූ දත්ත ඇසුරෙන් මෙවැනි වාර්ථාවක් හෝ ඉදිරිපත් කිරීමට හැකිවීම සම්බන්ධව මා සතුටට පත්වෙමි.

අතීතයේ පැවති විවිධ හැලහැප්පීම් බාධක පරයමින් වර්තමාන තරඟකාරී වෙළඳ පොළ තුල යලි ජාතික කාඩදාසි සමාගමේ ස්වාධිපත්‍ය පතුරුවාලීමට අවශ්‍ය සියළු ආකාරයේ තීන්දු තීරණ ගනිමින් සෑම අවස්ථාවකම මා දිරිගන්වමින් සහ සහයෝගය ලබා දෙමින් කටයුතු කරනු ලබන අතිගරු ජනාධිපතිතුමා, ගරු අමාත්‍යතුමා ඇතුළු එම කාර්යය මණ්ඩලය මෙන්ම මහා භාණ්ඩාගාරයේ නිලධාරී මඩුල්ලද ඉතාමත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

එමෙන්ම ආයතනයේ ක්‍රියාකාරකම් නිරතුරුව අධීකෂණය කරමින් අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙමින් අප කෙරේ විශ්වාසයෙන් යුතුව කටයුතු කරන අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය සහ අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය දේශීය කඩදාසියේ අනාගතය ගොඩනගන්නට මා වෙත ලබා දෙන මහඟු ශක්තියද ගෞරවයෙන් සිහිපත් කරන අතර කඩදාසි කර්මාන්තයේ පෙරගමන්කරුවන් ලෙස ශක්තිමත්ව සාමූහිකව මා සමග අත්වැල් බැඳගනිමින් ජාතික කාඩදාසි සමාගමේ උන්නතිය උදෙසා කැප වන සමාගමේ සේවක මඩුල්ලද ඉතාමත් සතුටින් හෘදයාංගමව සිහිපත් කරමි.

විමල් රූපසිංහ
සභාපති
ජාතික කඩදාසි සමාගම

2022

සභාපතිතුමා ඇතුළු වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය



කේ.ඒ.විමල් රූපසිංහ මහතා

සභාපතිතුමා



රුවිනි සේනාරත්න මහත්මිය

අධ්‍යක්ෂක



ජේ.බී. හීන්කෙන්ද මහතා

අධ්‍යක්ෂක



දිනුදු මුනිදාස මහතා

අධ්‍යක්ෂක



එස්.එස්. කැටවලගෙදර මහතා

අධ්‍යක්ෂක



එච්.ඩී.හිමාලි සී. විජේතුංග මහත්මිය

අධ්‍යක්ෂක



ජී.පී.එස්.එස්. වීරසූරිය මහතා

අධ්‍යක්ෂක

සංස්ථාපිත දැක්ම සහ මෙහෙවර

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ කඩදාසි කර්මාන්තයේ අභිවෘධිය සඳහා දායකවීම පිණිස, වර්තමානයේ නිෂ්පාදනය නොකරන මුද්‍රණ කඩදාසි ඡායා පිටපත් කඩදාසි සහ පිරිගණක ලිපිද්‍රව්‍ය වැනි කඩදාසි සහ වෙනත් බෝඩ් (පුවරු) නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අලෙවිකරණයේ පෙරගමන්කරු වීම.

අපගේ මෙහෙවර

ඉතා ලාභදායි පරිසර හිතකාමී ගනුදෙනුකරුවන් මූලික කරගත් තාක්ෂණය, මානව සම්පත් සහ විශිෂ්ඨ කළමණාකරණයක් ඇති සියළුම වර්ගවල කඩදාසි සහ බෝර්ඩ් (පුවරු) නිෂ්පාදනය කරනු ලබන සහ අලෙවි කරනු ලබන අතිශයින් නවෝත්පාදනය සහ විවිධාංගිකරණය කළ කඩදාසි සමාගමක් බවට පත්වීම.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

අන්තර්ගතය

2014 /2015 මූල්‍ය වර්ෂය

1. සංස්ථාපිත තොරතුරු
2. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
3. විගණකවරුන්ගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සංස්ථාපිත තොරතුරු : 2014 / 2015

නිසි බලධාරි - මංගල සී. සෙනරත් මහතා

<u>සමාගම් ලේකම්වරු</u>

දයානන්ද සමරවික්‍රම සහ සමාගම

වරලත් ගණකාධිකාරීවරු,
අංක 20/26, දුම්රියපළ පටුමග,
(ජනතා පොළ පාර),
නුගේගොඩ,ශ්‍රී ලංකාව.

<u>ලියාපදිංචි කාර්යාලය</u>

අංක 93, ජාවත්ත පාර,

කොළඹ - 05.

<u>විගණකවරු</u>

අර්න්ස්ට් ඇන්ඩ් යන්ග්
වරලත් ගණකාධිකාරීවරු,
201, ද සේරම් පෙදෙස,
තැ.පෙ. 101, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

<u>බැංකුකරුවෝ</u>

මහජන බැංකුව

ලංකා බැංකුව

ජාතික සංවර්ධන බැංකුව

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහිත වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරයි.

1. ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම

සමාගමේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම වන්නේ කඩදාසි සහ කඩදාසි පුවරු (පේපර් බෝර්ඩ්) වාලව්චේන කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කර අලෙවි කිරීමය.

2. කොටස් ප්‍රාග්ධනය

සීමාසහිත ජාතික කඩදාසි සමාගම මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ 100% කොටස් අයිතියකින් යුක්ත රාජ්‍ය අයිතිය සතු ව්‍යාපාර ඒකකයකි. එහි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 323කි. (එනම් කොටස් ප්‍රාග්ධනය රුපියල් 10/- බැගින් වූ කොටස් 32,300,000 කින් සම්න්විතවේ).

3. පිරිවැටුම

2015.03.31 දිනෙන් අවසාන ගිණුම් වර්ෂයේ සමාගමේ ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 74,905 කි.

4. සමාගමේ නිෂ්පාදන පිරිවැය

සළකා බලනු ලබන කාල පර්ච්ඡේදය තුල වාලව්චේන කම්හලෙහි නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 243,118 කි.

5. ප්‍රාග්ධන වියදම්

සීමාසහිත ජාතික කඩදාසි සමාගම ප්‍රතිව්‍යුහගතකරණයට වෙන්වූ දින සිට එහි ප්‍රාග්ධන වියදම් ඉතා අල්ප ප්‍රමානයට සීමා කරන ලදි.

6. සමාගම සම්බන්ධයෙන් ගිවිසුම් වලට එළඹීමට අධ්‍යක්ෂකවරුන් දැක්වූ ඇල්ම.

2015.03.31 දිනෙන් අවසන් වර්ෂයේදි සමාගමේ අධ්‍යක්ෂකවරු සෘජුව හෝ වක්‍රාකාරව සමාගම සමග ගිවිසුම් වලට එළඹීමට නොහැක.

7. විගණකවරු

සමාගමේ 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ විගණනය කරන ලද්දේ වරලත් ගණකාධිකාරිවරුන් වන අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් විසිනි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

2015 මාර්තු 31

මූල්‍ය ප්‍රකාශය

ලාංඡනය- ඊවයි
යහපත් වැඩ
පරිසරයක් ගොඩනඟමු

අර්නස්ට් ඇන්ඩ් යං
වරලත් ගණකාධිකාරීවරු
201, ද සේරම් පෙදෙස
තැ.පෙ. 101
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

දුර : +94 11 2463500
පොදු ෆැක්ස් : +94 11 2697369
ටැක්ස් : +94 11 5578180
eysl@lk.ey.com
ey.com

පීඑන්එස්/කේඒවීඑස්/ජේපේ

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ කොටස් හිමියන් සඳහා වන

ස්වාධීන විගණන වාර්තාව

අපි සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ (සමාගමේ) පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශයන් විගණනයට ලක් කළෙමු. එයට 2015 මාර්තු 31 වනවිට පැවැති මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ලාභ සහ අලාභ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ එයින් අවසන් වූ වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වෙනත් සවිස්තර සටහන් ඇතුළත් ය.

මූල්‍ය ප්‍රකාශය සඳහා කළමනාකරණයේ වගකීම

ශ්‍රී ලංකාවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම කළමනාකරණයේ වගකීමකි. වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව, මූල්‍ය ප්‍රකාශය සූදානම් කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ පරිදි අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් තෝරාගැනීම සහ එය ක්‍රියාවේ යෙදවීම සහ පවතින තත්ත්වය යටතේ සාධාරණ බවට පිළිගත හැකි ගිණුම්කරණ තක්සේරු කිරීම් සිදුකිරීමට උචිත පරිදි සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම මේ වගකීමට ඇතුළත් ය.

විගණනකගේ විෂය පථය

අපගේ වගකීම වන්නේ ශ්‍රී ලංකාවේ පිළිගත් විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනය මත මූල්‍ය ප්‍රකාශ පදනම් කරගෙන මතයක් ප්‍රකාශ කිරීමයි. මේ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර බව පිළිගත හැකි පරිදි තහවුරු කිරීමට අප විසින් සැලසුම් සකස්කර ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත් මතය ව්‍යාචනය කිරීම ගැන සම්බන්ධ පරිච්ඡේදයේ දී විස්තර කර ඇති පරිදි, විගණන මතය ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් වන තරමට විගණන සාක්ෂි එක්රැස් කර ගැනීමට අපට නොහැකි විය.

මතය ව්‍යාචනය කිරීමේ පදනම

01. මෙම සමාගමේ 2014 මාර්තු 31 වැනිදාට නියමිත මූල්‍ය ප්‍රකාශය විගණන සමාගමක් විසින් විගණනයට ලක්කර 2017 පෙබරවාරි 02 වැනිදා වෙනත් ප්‍රතිවිරුද්ධ මතයක් ව්‍යාචනය කර තිබූ අතර ආරම්භක ශේෂය ගැන විගණන මතය ඉදිරිපත් කිරීමට සහ ප්‍රතිවිරුද්ධ මතය ගැන අදහසක් ප්‍රකාශ කිරීමට තරම් ප්‍රමාණවත් වන විගණන සාක්ෂි එක්රැස් කර ගැනීමට අපට නොහැකි විය.

02. වාලච්චේනේ කර්මාන්ත ශාලාවට ඇතුළු වීමට සහ එහි තිබූ අදාළ වාර්තාවලට ප්‍රවේශ වීමට සහ කළින් වාර්තාවලට අදාළ ලිපිගොනුවලට ප්‍රවේශ වීමට අපට අවස්ථාව ලබා දුන්නේ නැත.

තවද ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව 2011 නොවැම්බර් 15 වැනිදා ඕස් ලංකා පේපර් කම්පනි වෙත බැහැර කර තිබූ අතර බැහැර කිරීමේ ගිවිසුම හෝ ඒ සම්බන්ධ ප්‍රමාණවත් තොරතුරු අපට විමසා බැලීම සඳහා ලැබුණේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස පහත දැක්වෙන ශේෂයන් තහවුරු කිරීමට අපට නොහැකි විය.

විස්තර	ඇඹිලිපිටිය 000''	වාලච්චේනේ 000''
මුළු ජංගම නොවන වත්කම්	17,886	38,344
මුළු ජංගම වත්කම්	11,202	177,767
මුළු ජංගම නොවන වගකීම්	483,757	406,086

(සබැඳේ...2/-)

3. ප්‍රධාන කාර්යාලය යටතේ වාර්තා කර ඇති ශේෂය සම්බන්ධව

3.1 දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ නිසි වාර්තා පවත්වාගෙන ගොස් නැත. එබැවින් ශේෂ පත්‍රයේ වාර්තා කර ඇති රු. 33,376,922/= ක දේපළ, පිරියත සහ උපකරණ ශේෂය ගැන තහවුරු කිරීමට අපට නොහැකි විය.

3.2 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණක වශයෙන් 2016 දෙසැම්බර් 23 වැනිදා අපව පත් කරන ලදී. ඒ එම වසර අවසානයේ දී ය. එසේ වෙතත් එයින් පසුව භෞතික තොගය ගණන් කිරීමට වසර අවසානයේ දීවත් කටයුතු කළ බව නිරීක්ෂණය නොවීය. එසේම එසේම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු. 15,926,363/= ක වටිනාකමකට තොගයේ ප්‍රමාණයන් ගැන සමාගම ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් නොමැත.

3.3 අපට මූල්‍ය ප්‍රකාශයේ පිළිවෙළින් රු. 257,200,355/=ක සහ රු. 471,307,505/=ක වෙළෙඳ සහ වෙනත් ලැබීම් සහ වෙළෙඳ සහ වෙනත් ගෙවීම් පිළිබඳ සෘජුවම තහවුරු කිරීම් ලබා ගැනීමට අවස්ථාව ලැබුණේ නැත.

3.4 මූල්‍ය ප්‍රකාශයේ සඳහන් රු. 45,087,534/=ක සහ රු. 41,777,052/=ක මූල්‍ය සංචිත සහ විදේශ ප්‍රදාන තහවුරු කිරීමට ප්‍රමාණවත් තරම් විගණනමය සාක්ෂි අපට හමුවූයේ නැත. එසේම ආදායම් සංචිතයට බැර කර තිබූ රු. 103,258/=ක් ගැන ප්‍රමාණවත් තොරතුරු හෝ පිළිගත හැකි තොරතුරු අපට ලැබුණේ නැත.

3.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන්ව තිබූ රු. 159,654,648/=ක විදේශ ණය පිළිබඳ සෘජුව තොරතුරු තහවුරු කර ගැනීමට අපට අවස්ථාව උදා කළේ නැත. එම ණය මුදලට අදාළ ණය ගිවිසුමක් හෝ ණය හා සම්බන්ධ ප්‍රමාණවත් තරම් තොරතුරු හෝ විමසා බැලීම සඳහා අපට ලබා දුන්නේ නැත.

3.6 වාර්තාව සිදු කරන දිනය වන විට රු. 100,681,254/=ක සමාගම ගෙවිය යුතුව තිබූ පාරිතෝෂික ප්‍රමාණයක් වාර්තා වී තිබිණි. ප්‍රතිපාදන සඳහා පදනම සහ වසර තිස්සේ ගෙවීම් සිදු කළ ආකාරය ගැන තොරතුරු විමසා බැලීම සඳහා අපට ලැබුණේ නැත.

3.7 මූල්‍ය ප්‍රකාශයේ සඳහන්ව තිබූ රු. 74,905,615/=ක සහ රු. 243,140,251/=ක අලෙවි වියදම් වාර්තාවල ආදායම සහ නිවැරැදිභාවයේ පරිපූර්ණත්වය ගැන පාලන ඌනතා සහ විගණන පියවරයන්වල මදකම නිසා අපට තහවුරු කිරීමට නොහැකි විය.

3,8 සමාගම වැට්, එන්බීටී, ඊඑස්ඩී සහ ආදායම් බදු වැනි ව්‍යවස්ථාපිත බදු ගෙවීමට වගකීම දරයි. එසේ වෙතත් සමාගම නිසි පරිදි හිඟ වාරික ගෙවා ඇත්දැයි තහවුරු කිරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි මූල්‍ය ප්‍රකාශවල හමුවූයේ නැත.

3.9 ප්‍රමාණවත් තරම් විගණනමය සාක්ෂි නොමැති වීම නිසා පහත වගුගත කර ඇති ලාභ සහ අලාභ ගිණුම්වල වියදම් වාර්තා තහවුරු කිරීමට අපි අපොහොසත් වීමු.

විස්තරය	ප්‍රමාණය රුපියල්
වැටුප් සහ වේතන	20,705,764
සේවක භාර අරමුදල	528,085
සේවක අර්ථසාධක අරමුදල	2,112,340
කුලී, පොළී සහ බදු	3,756,229
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල දීමනා	1,440,467
වාහන බදු කුලී	1,035,000
අලුත්වැඩියා සහ නඩත්තු	2,852,751
පරණ කඩදාසි වියදම්	3,222,458

ඉහත 1 සිට 3.9 දක්වා වගන්තිවල සඳහන් කාරණා ගැන අපට තෘප්තිමත් වීමට නොහැකිය. සමාගමේ අඛණ්ඩ පැවැත්ම ගැන කල්පනා කරන විට පහත සඳහන් කාරණා ගැන ද තොරතුරු අපට හඳුනා ගැනීමට හැකි විය.

(සබැඳේ...3/-)

4. සමාගම මූල්‍ය ප්‍රකාශය සකසා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙනය. කෙසේ වෙතත් වාර්තාව සිදු කරන දිනය වන විට පහත දැක්වෙන තත්ත්ව ඉදිරිපත් ව තිබිණි.

- වාලච්චේන කර්මාන්ත ශාලාව වසර තිස්සේ ම එහි වැඩ කටයුතු නතර කර තිබිණි.
- 2011 නොවැම්බර් 15 වැනිදා ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව බැහැර කර තිබිණි.
- 2015 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා සමාගම රුපියල් මිලියන 123ක පාඩුවක් වාර්තා කර තිබිණි. (2014 මාර්තු 31න් අවසන් වූ වසර සඳහා රුපියල් මිලියන 209ක පාඩුවක් වාර්තා විය.)
- 2015 මාර්තු 31 වන විට රුපියල් මිලියන 1,090ක ඍණ ශුද්ධ වත්කම් මට්ටමක් වාර්තා කර තිබිණි. (2014 මාර්තු වන විට රුපියල් මිලියන 967කි)

ඉහත 1 සිට 3.9 දක්වා වගන්තිවල දැක්වූ කරුණු සහ මෙම කරුණු එකතු වූ විට ඇතිවන වාස්තවික අස්ථාවරභාවය හේතුවෙන් සමාගම අඛණ්ඩ පැවැත්මක් තහවුරු කර ගනීදැයි පැහැදිලි සැකයක් ඇති වේ. අදාළ තත්ත්වය අත්පත් කර ගැනීම සඳහා අනුගමනය කරන නිසි කළමනාකරණ වැඩසටහනක් දක්නට නොමැති බැවින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට හැකි යැයි සිතීම අපහසුය.

ඉහත කී කාරණා පදනම් කරගෙන බලන කල සමාගමේ වත්කම් සහ වගකීම් පිළිබඳ සැලකීමේ දී 2015 මාර්තු 31 වන විට ලාභ සහ අලාභ පිළිබඳ ස්ක්නධ වෙනස් වීමේ ප්‍රකාශයේ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ 2015 මාර්තු 31 වන විට කිසියම් ගැලපීම් සිදු කළ යුතු දැයි හඳුනාගැනීම දුෂ්කරය.

මතය ව්‍යාචනය කිරීම

මතය ව්‍යාචනය කිරීම නැමැති ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බරපතලකම අනුව, විගණන මතයක් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් තරම් සුදුසු විගණන සාක්ෂි එක්රැස් කරගැනීමට අපට නොහැකි විය. ඒ අනුව අපි මූල්‍ය ප්‍රකාශය ගැන මතයක් ප්‍රකාශ නොකරමු.

වෙනත් කාරණා

2014 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වර්ෂයේ දී සමාගමේ මූල්‍ය ප්‍රකාශය ගැන කටයුතු කළ වෙනත් විගණන සමාගමක් පහත කාරණා සම්බන්ධයෙන් වෙනත් අදහසක් ප්‍රකාශ කරයි.

01) පරීක්ෂා කිරීම සඳහා අපට ලබාදුන් මූල්‍ය ප්‍රකාශ, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන ආකෘතිය **LKAS 01** (මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම) යටතේ එන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව නොතිබූ බැවින් ඒ ගැන සතුටට පත්විය නොහැක. ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාවේ පිහිටා ඇති අක්කර 525කින් සමන්විත වගාබිම් 5හේ (සටහන 15) වටිනාකම 11,188,275/- ක් ලෙස වසර ගණනාවක් අඛණ්ඩව නොවෙනස්ව සටහන්ව ඇති අතර එය තහවුරු කළ නොහැක.

02) සීමාසහිත ජාතික කඩදාසි සමාගම යටතේ ක්‍රියාත්මක කර්මාන්ත ශාලා දෙක අතරින් ඇඹිලිපිටියේ පිහිටි කර්මාන්ත ශාලාව 2011 නොවැම්බර් 15 වැනිදා රාජ්‍ය සම්පත් සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ටෙන්ඩරයක් මඟින් ඕස් ලංකා පේපර් කම්පනි ලිමිටඩ් වෙත බැහැර කර ඇති අතර බැහැර කිරීමේ ගිවිසුමේ අඩංගු නියම සහ කොන්දේසි සම්පූර්ණ නොමැති අතර ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව බැහැර කිරීම පිළිබඳ පිළිගත් ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් නොමැත. මේ බැහැර කිරීම සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය (විමර්ශන අංක- FCID/145/15) සහ ජනාධිපති පරීක්ෂණ කොමිසමක් (විමර්ශන අංක- PCI 859/2015) වර්තමානයේ පරීක්ෂණ පවත්වයි. මේ තත්ත්වය නිසා අපට මේ සම්බන්ධයෙන් කිසියම් අදහස් දැක්වීමක් සිදුකළ නොහැක.

03) දේපළ, පිරියත සහ උපකරණ ගැන නිසි වාර්තා පවත්වාගෙන ගොස් නොමැත. එසේම ඇතැම් ස්ථාවර වත්කම් අපට සොයාගැනීමට නොහැකි විය. අබලි ද්‍රව්‍ය බැහැර කිරීමේ දී සමාගම නිවැරැදි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. තවද ඇතැම් ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ම ක්ෂය වී ඇතත්, සමහර ඒවා තවමත් භාවිතයේ පවතින බව අප සොයාගත් අතර ඒවා නැවත තක්සේරු කිරීමට

සමාගම පියවර ගෙන නොමැති බව අපට නිරීක්ෂණය විය. **LKAS 16 (දේපල, පිරියත සහ උපකරණ)** දේපල, පිරියත සහ උපකරණ සහ අනිකුත් වත්කම්වලට සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව අවශේෂ අගයන්, ක්ෂය වීම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී යෝග්‍ය පරිදි සමාලෝචනය කර සකස් කිරීම අවශ්‍ය වේ.

(සබැඳේ...4/-)

04) වාලච්චේනේ කර්මාන්ත ශාලාවේ අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව පහත දැක්වෙන නඩු හතරක් නෛතික බලධාරීන් හමුවේ විභාග වෙමින් පවතියි.

නෛතික බලධාරියා	නඩු / පරීක්ෂණ ලිපිගොනු අංකය
1. අල්ලස් කොමිසම	B/C 3067/2012 B/15
2. වංචා කාර්යාංශය	IR 606/03/15
3. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව	B 201-2016
4. වාලච්චේනේ මහේස්ත්‍රාත් උසාවිය	B 661/12

ඉහත දක්වා ඇති නඩු හතරේ දක්වා ඇති කාරණාවලට අමතරව සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ අබලි ද්‍රව්‍ය බැහැර කිරීමේ දී නිවැරැදි පියවර අනුගමනය කර නොමැති අතර අබලි ද්‍රව්‍ය සඳහා ගෙවීම් කළ චෙක්පත් උපලබ්දි වීමට පෙර එම අබලි ද්‍රව්‍ය නිදහස් කර ඇත.

05) සමාගමට කම්කරු විනිශ්චය සභාවේ නඩු කිහිපයක් ඇති බව අපි නිරීක්ෂණය කළෙමු. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සම්බන්ධ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරා නොමැති අතර 2014.03.31 දිනය වන විට ප්‍රමාද ගාස්තු සඳහා අධිභාර ගෙවීමට පියවර ගෙන නොමැත.

කෙසේ වෙතත් අප පරීක්ෂා කළ නියැදියට අනුව, ඒ වන විට හඳුන්වා දී තිබූ ස්වේච්ඡා විශ්‍රාම ගැනීමේ සැලැස්මට අනුව ඔවුන්ට ලැබිය යුතුව තිබූ ඒ ආකාරයේ ගෙවීම් ගෙවා ඇති බව දක්නට ලැබිණි.

LKAS **37**ට අනුව ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ අවිනිශ්චිත වගකීම් සඳහා ප්‍රතිපාදන සහ හෙළිදරව් කිරීම් අවශ්‍ය වේ. එහෙයින් සමාගමේ මූල්‍ය ප්‍රකාශය LKAS 37 ව්‍යවස්ථාවන්ට අනුකූල පරිදි ඉදිරිපත් කර නොමැත.

06) **සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ උනන්දුව**

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වූ මූල්‍ය වසර අතරතුර සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව දැක්වෙන කිසිදු තොරතුරක් කළින් විගණකවරු අපට ඉදිරිපත් කර නොමැත. එසේම නිසි බලධාරීන් විසින් සමාගමේ කළමනාකරණ කටයුතු සිදු කිරීම සඳහා 2012 අප්‍රේල් 02 වැනිදා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලැබ ඇති බව අපට නිරීක්ෂණය විය.

අනිකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

අයිතිය අත්හැරීමේ ඡේදයේ කැපී පෙනෙන පරිදි විස්තර කර ඇති කරුණු පරිදි අපගේ මතය වන්නේ, මතයක් ප්‍රකාශ කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි රැස් කිරීමට අප සමත් වී නොමැති බවයි. එබැවින් 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) දරණ කොටසේ විධිවිධානයන්ට අනුව අප මතයක් ප්‍රකාශ කරන්නේ නැත.

අත්සන අර්නස්ට් ඇන්ඩ් යං

2019 ජනවාරි 16

කොළඹ

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

2015 මාර්තු 31 වන විට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2015 රු	2014 රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	4	88,827,869	90,823,839
දීර්ඝ කාලීන ආයෝජන	5	(1,964,561)	56,484,145
		86,863,308	147,307,984
ජංගම වත්කම්			
බඩු ලේඛනය	6	136,275,892	133,794,636
වෙළෙඳ සහ අනිත් ලැබීම්	7	311,535,710	286,399,252
මුදල් සහ මුදල්වලට සමාන දෑ	13.1	18,673,610	2,203,853
		466,485,212	422,397,741
මුළු වත්කම්		553,348,520	569,705,725
ස්කන්ධ හා වගකීම්			
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	8	323,000,000	323,000,000
විදේශ ප්‍රදාන		41,777,052	41,777,052
ප්‍රාග්ධන සංචිත		45,087,534	45,087,534
රඳවාගත් පාඩුව		(1,500,796,172)	(1,377,260,670)
		(1,090,931,586)	(967,396,084)
ජංගම නොවන වගකීම්			
පොලී ධාරක ණය සහ මුදල් ගැනීම්	12	162,715,313	164,603,934
		162,715,313	164,603,934
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙත් ගෙවිය යුතු දේ	9	1,362,765,222	1,220,219,461
ධාරක ණය සහ මුදල් ගැනීම්වල ජංගම පොලී කොටස	12	1,973,287	1,395,005
ආණ්ඩුවට ගෙවිය යුතු දේ	9	100,681,254	88,486,726
බැංකු අයිරා	13.2	16,145,030	62,396,683
		1,481,564,793	1,372,497,875
මුළු ස්කන්ධ සහ වගකීම්		553,348,520	569,705,725

2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කළ බව මම සහතික කරමි.

අත්සන අපැහැදිලියි
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශයේ වගකීම නිසි බලධාරියා විසින් භාර ගැනේ.

අත්සන අපැහැදිලියි
නිසි බලධාරියා

මූල්‍ය ප්‍රකාශයේ පිටු අංක 09 සිට 16 දක්වා ඇති විගණන ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේ ම කොටස් වේ.

අර්නස්ට් ඇන්ඩ් යං නිල මුද්‍රාව

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ලාභ සහ අලාභ ප්‍රකාශය
2015 මාර්තු 31 වන විට අවසන් වන වසර

	සටහන්	2015	2014
		රු.	රු.
ආදායම	3	74,905,615	77,131.69
විකුණුම් පිරිවැය		(243,118,251)	(258,628.27)
දළ අලාභ		(168,212,636)	(181,496,583)
වෙනත් ආදායම්	3.1	94,769,476	13,461,978
පරිපාලන වියදම්		(34,653,539)	(30,624.230)
විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්		(7,779,378)	(7,256,138)
අනිකුත් මෙහෙයුම් වියදම්		(3,222,458)	(2,574.498)
වසරේ මෙහෙයුම්වලින් ලැබුණු අලාභය		(119,098,535)	(208,489.471)
මූල්‍ය ආදායම්	10	4,499,115	7,203,080
මූල්‍ය වියදම්	11	(8,705,267)	(7,377,810)
වෙනත් වියදම්		(334,072)	(562,500)
බදු ගෙවීමට පෙර අලාභය		(123,638,759)	(209,226,700)
ආදායම් බදු වියදම්		-	-
වසරේ අලාභය		(123,638,759)	(209,226,700)

මූල්‍ය ප්‍රකාශයේ පිටු අංක 09 සිට 16 දක්වා ඇති විගණන ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේ ම කොටස් වේ.

ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය
2015 මාර්තු 31 වන විට අවසන් වන වර්ෂය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල්	විදේශ ප්‍රදාන රුපියල්	ප්‍රාග්ධන සංචිත රුපියල්	දරාගෙන සිටි අලාභය රුපියල්	එකතුව රුපියල්
2013.04.01 දින වන විට ශේෂය	323,000,000	41,777,052	45,087,534	(934,990,457)	(525,125,872)
අලාභය මත ගැලපීම්	-	-	-	(233,043,512)	(233,043,512)
වසරේ ශුද්ධ අලාභය	-	-	-	(209,226,700)	(209,226,700)
2014.03.31 දින වන විට ශේෂය	323,000,000	41,777,052	45,087,334	(1,377,260,670)	(967,396,084)
අලාභය මත ගැලපීම්	-	-	-	103,258	103,258
වසරේ ශුද්ධ අලාභය	-	-	-	(123,638,759)	(123,638,759)
2015 මාර්තු 31 වන විට ශේෂය	323,000,000	41,777,052	45,087,534	(1,500,796,172)	(1,090,931,586)

මූල්‍ය ප්‍රකාශයේ පිටු අංක 09 සිට 16 දක්වා ඇති විගණන ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේ ම කොටස් වේ.

මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

	2015	2014
	සටහන් රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මූල්‍ය ප්‍රවාහය		
බදුවලට පෙර අලාභය	(123,638,759)	209,226.70
පසුගිය වසර සඳහා ආරම්භක ශේෂයේ වෙනස සඳහා ගැලපීම්		9,254.90
ගැලපීම්		
ක්ෂය වීම්	5,322,543	6,006.75
සමුච්චිත ක්ෂය වීම් ගැලපීම් - ඇඹිලිපිටිය	-	(6,948.93)
අබලි ද්‍රව්‍ය බැහැර කිරීමෙන් අලාභ	8,572	-
පොලී ආදායම්	(4,499,115)	(7,203.08)
මූල්‍ය වියදම්	8,705,267	7,182.51
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් අලාභය	(113,998,235)	(200,934.54)
බඩු තොගවල (ඉහළ යාම්)/ පහළ යාම්	(2,481,254)	(27,575,86)
ලැබීම්වල (ඉහළ යාම්)/ පහළ යාම්	(24,912,654)	(4,531,89-)
ගෙවිය යුතු ඉහළ යාම්/ (පහළ යාම්)	142,545,760	168,669,84-
ආණ්ඩුවට ගෙවිය යුතු ඉහළ යාම්/ (පහළ යාම්)	12,194,528	-
මෙහෙයුම්වලින් ජනිත වූ/ (යොදාගත්) මුදල්	13,348,146	(9,220,73-)
ගෙවූ මූල්‍ය වියදම්	(8,705,267)	(7,182,51-)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබූ/ (යොදාගත්) මූල්‍ය ප්‍රවාහය	4,642,879	(16,403,24-)
ආයෝජනවලින් ලැබූ මූල්‍ය ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම්	(3,381,140)	(1,809,685)
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ලැබීම් ප්‍රමාණය	45,995	-
ස්ථාවර තැන්පතුවල කල්පිරීම්	58,448,707	(3,278,622)
ලැබූ පොලිය	4,499,115	7,203,080
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	59,612,677	2,114,773
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මූල්‍ය ප්‍රවාහය		
ආණ්ඩුවෙන් ලැබීම්	-	9,063,851
ණය ලැබීම්	9,760,645	-
දිගුකාලීන ණය නැවත ගෙවීම්	(10,174,650)	-
කල්බදු කුලී ගෙවීම්	(1,120,440)	(395,811)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා (යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය	(1,534,145)	8,668,040

ශුද්ධ මූල්‍ය (භාවිත කළ)/ මුල්‍ය ක්‍රියාකාරකම්වලින්

කාලසීමාව ආරම්භයේ මුදල් සහ මුදල්වලට සමාන දෑවල වර්ධනය (අ සටහන)	62,721,410	(5,620,427)
කාලසීමාව ආරම්භයේ මුදල් සහ මුදල්වලට සමාන දෑවල වර්ධනය (ආ සටහන)	(60,192,830)	(54,572,403)
	2,528,580	(60,192,830)

සටහන - අ

වාසිදායක මුදල් ශේෂය	2,203,853	20,022
අවාසිදායක මුදල් ශේෂය	(62,396,683)	1,475,670
	(60,192,830)	1,495,692

සටහන - ආ

වාසිදායක මුදල් ශේෂය	18,673,610	2,203,853
අවාසිදායක මුදල් ශේෂය	(16,145,030)	(62,396,683)
	2,528,580	(60,192,830)

මූල්‍ය ප්‍රකාශයේ පිටු අංක 09 සිට 16 දක්වා ඇති විගණන ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේ ම කොටස් වේ.

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

1. ආයතනික තොරතුරු

1.1 පොදු

සීමාසහිත ජාතික කඩදාසි සමාගම (''සමාගම'') 1992 ජූලි 1 වැනිදා සිට ශ්‍රී ලංකාවේ ස්ථාපිත සම්පූර්ණයෙන් රජයට අයත් වගකම් සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ කොළඹ 05, ජාවත්ත, අංක 93 දරණ ස්ථානයේ ය.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ කඩදාසි සහ කඩදාසි බෝර්ඩ් නිෂ්පාදනය කිරීමයි. වසර තිස්සේ සමාගම සිය ප්‍රධාන මෙහෙයුම්වල නිරත වූයේ නැත.

1.3 නිකුත් කිරීමේ බලය

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා ජාතික කඩදාසි සමාගමේ මූල්‍ය ප්‍රකාශය, නිසි බලධාරියා විසින් 2018 නොවැම්බර් 05 වැනිදා නිකුත් කිරීමට බලය පැවැරීය.

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

2.1 අඛණ්ඩ පැවැත්ම

සමාගම 2015 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වර්ෂයේ දී රු. 123,638,759/=ක අලාභයක් වාර්තා කර ඇත. (2014 මාර්තු 31 වැනිදා එය රු. 209,226,700/=ක් විය) එසේම එදින වන විට සමාගමේ ජංගම වගකීම් රු. 1,015,079,581/=කින් ජංගම වත්කම් ඉක්මවා වාර්තා විය. (2014 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වර්ෂයේ දී රු. 950,100,134/=ක් විය) එසේම එහි මුළු වගකීම් රු. 1,090,931,586/= කින් මුළු වත්කම් ඉක්මවා වාර්තා වී ඇත. (2014 මාර්තු 31 වැනිදා අවසන් වූ වසරේ දී එය 967,396,084ක් විය) තවද මෙම වසරේ දී සමාගම සිය ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සිදුනොකළ බැවින් එම වසරේ දළ අලාභය රු. 168,212,636/=ක් ලෙස වාර්තා විය. (2014 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වර්ෂයේ දී 181,946,583/=ක් විය) එසේම අමාත්‍යාංශයෙන් ලබා දුන් මූල්‍ය සහනයන් මත දැඩි ලෙස රඳා පැවැතිණි. මේ කාරණා මත සමාගමට අඛණ්ඩ පැවැත්මක් අත්පත් කර ගත හැකි දැයි යන්න ගැන සාධාරණ සැකයක් මතු වේ.

2.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.2 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් ගණනය කරනු ලබන්නේ බදු අය කිරීමේ බලධාරීන් වෙතින් අයකර ගන්නා හෝ ගෙවීමට නියමිත ප්‍රමාණයන් අනුවය. ප්‍රමාණය ගණනය කිරීමට සලකා බලන්නේ වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයේ බලපවත්වන හෝ සැලකිය යුතු පරිදි බලපවත්වන බදු අනුපාත සහ බදුකරණ නීති වේ.

2.2 විලම්බිත බදු

බදු අලාභ හේතුවෙන් විලම්බිත බදු සම්පාදනය කර නොමැත.

2.2 මුදල් සහ මුදල්වලට සමාන දේ

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාව වෙනුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් සහ මුදල්වලට සමාන දේ බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල්වලින් සමන්විත වේ.

2.2 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශනය වන්නේ, වියදම, එදිනෙදා සේවා කටයුතුවල වියදමෙන් අඩු කොට සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩු කිරීමෙනි. එවැනි වියදම්වලට යන්ත්‍ර සහ පිරියතවල කොටස් නැවත ස්ථාපනය කිරීම සඳහා යන වියදම් ඇතුළත් වේ. පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම් පිරිවැය දැරීමට සිදුවේ.

වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය පදනම් කරගෙන සරල රේඛීය ක්‍රමය යටතේ ක්ෂය ගණනය කර ඇති අතර එයින් අනාවරණය වූ කරුණු මූල්‍ය ප්‍රකාශයේ අංක 4.4 සටහනේ දක්වා ඇත.

පිරිවිතරයක සහ උපකරණයක අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන විට එය බැහැර කිරීමට ලක් කර ඇත. එම වත්කම බැහැර කිරීමෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් (එම වත්කමේ ඉදිරියට ගෙන ආ ප්‍රමාණයේ සහ ශුද්ධ බැහැර කිරීමේ පියවරයන් හි වෙනස ගණනය කිරීම මඟින්) වෙත්නම් එම වත්කම බැහැර කිරීම සිදු කරන කාලසීමාවේ ලාභ සහ අලාභ ප්‍රකාශයේ ඇතුළත් කෙරේ.

පිළිගත්, ප්‍රමිතිගත තක්සේරුවකින් අනතුරුව, අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන්, දේපළ, පිරියත සහ උපකරණවල, අලුත්වැඩියා කටයුතු හෝ නඩත්තු කටයුතු සඳහා වැය කළ වියදම ඇති වූ අවස්ථාවේ ම පිරිවැයක් ලෙස හඳුනා ගනී.

වත්කම්වල අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ක්ෂය විමසීමට ලක්කර ඇති ආකාරය විමසා බලා සෑම මූල්‍ය කාල පරිච්ඡේදයක් අවසානයේදීම සුදුසු පරිදි සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

2.3 විශ්‍රාමික පාරිතෝෂික බැඳීම

අ) නිර්වචනය කර ඇති ප්‍රතිලාභ සැලැස්ම- පාරිතෝෂික.

සේවකයින් විශ්‍රාමික පාරිතෝෂික ලැබීමට සුදුසුකම් ලබන අවස්ථාවේ ඒවා ලබා දීමට විධිවිධාන සලසා තිබේ. සියලුම පාරිතෝෂික ප්‍රතිලාභ සකසා ඇත්තේ 2014 මාර්තු 31 වැනිදා දක්වාය. 2015 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වර්ෂය සඳහා පාරිතෝෂික සකසා නොමැත. එසේම විශ්‍රාමික සේවකයින් ගණනාවක් තම පාරිතෝෂික ලබා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ගවලට ප්‍රවේශ වී ඇති අතර එම නඩු තවමත් විභාගවෙමින් පවතියි.

ආ) අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්ම - සේඅඅ සහ සේභාඅ

අදාළ නීති රීතිවලට අනුව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට දායකත්වයන් ලබා ගැනීමට හිමිකම් ලබයි. සමාගම සේවකයින්ගේ වැටුපෙන් පිළිවෙළින් සියයට 12ක් සහ සියයට 3ක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට බැර කරයි.

කෙසේ වෙතත් සමාගම කොන්ත්‍රාත් සේවකයින්ගෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට දායකත්වයන් කපා ගන්නේ නැති අතර එය 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ සහ 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනතේ විධිවිධානයන්ට අනුව අනුමත කළ හැකි තත්ත්වයක් නොවේ.

1.1.1 තොග ලේඛනය

යල්පිනූ සහ සෙමින් අලෙවි වන අයිතමවල ගෙවිය යුතු දීමනා සැකසීමෙන් අනතුරුව, තොගවල වටිනාකම, අවම වියදම සහ නිකුත් කරන විට ශුද්ධ උපලබ්ධි අගය අනුව ගණනය කෙරේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය වෙළෙඳාමේ දී තොගය අලෙවි කළ හැකි මිලෙන් සමාප්තියේ දී තක්සේරු කළ මිල සහ අලෙවිය සිදු කිරීමට අවශ්‍ය තක්සේරු කරන ලද වියදම අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

බඩු තොග එහි වත්මන් පරිශ්‍රය වෙත සහ එහි වත්මන් තත්ත්වයට ගෙන ඒමේදී දැරූ වියදම බර තැබූ සාමාන්‍ය තක්සේරුවක් කිරීමට පදනමක් ඇති කරයි.

2.3.1 වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්

ලැබිය යුතු ශුද්ධ හානිය සාක්ෂාත් කර ගැනීම සඳහා ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයෙන් වෙළෙඳ ලැබීම් ප්‍රකාශ කරනු ලැබේ. වියදමෙන්, වෙනත් ලැබීම් හානිකරණය අඩු කිරීමෙන් වෙනත් ලැබීම් හඳුනාගත හැකි වේ.

2.3 වෙන් කිරීම්, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

සමාගමට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන වගකීමක් ඇති වූ විට (නෛතික හෝ සම්මුතික) ප්‍රතිපාදන පිළිගනු ලැබේ. වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇතැයි සිතිය හැකි අතර වගකීම් ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිය.

තමන්ගේ කාර්ය මණ්ඩල වගකීම් සහ උසස් වීම් සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයේ ඇතැම් පිරිසක් නෛතික පියවර ගෙන ඇත. මේ නඩු තවමත් විභාග වෙමින් පවතියි.

2.4 ආදායම් ප්‍රකාශය

2.4 ආදායම් පිළිගැනීම

සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති තරමට ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම සහ ඒ ආශ්‍රිත පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැක.

ආදායම මනිනු ලබන්නේ ලැබීම් හෝ ලැබීමට නියමිත දේවල සාධාරණ වටිනාකම සලකා බැලීමෙනි.

ආදායම සොයාගැනීමේ අවශ්‍යතාව සඳහා පහත විශේෂ ක්‍රමවේදය අනුගමනය කෙරිණි.

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

අ) භාණ්ඩ අලෙවි කිරීම

භාණ්ඩ විකිණීමෙන් ලබන ආදායම හඳුනා ගන්නේ සාමාන්‍යයෙන් භාණ්ඩ යැවීමේ දී භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත පැවැරී ඇති විටයි.

ආ) පොලිය

වත්කම්වල ඵලදායී පොලී අනුපාත සැලකිල්ලට ගන්නා කාල සමානුපාතික පදනම මත ආදායම හඳුනා ගැනේ.

ඇ) ලාභාංශ

කොටස් හිමියන්ගේ ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු කිරීමක් වශයෙන් ලාභාංශ ආදායම පිළිගැනේ.

ඈ) වෙනත්

අනිත් ආදායම් සැබෑ පදනමින් පිළිගැනේ.

2.4 වියදම් හඳුනා ගැනීම

ලාභ සහ අලාභ ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධයක් මතය.

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා, සමාගමේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන පදනම මත සමාගම ''වියදම්වල කාර්යය ක්‍රමය'' අනුගමනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

	2015	2014
	රු.	රු.
3. ආදායම		
දළ ආදායම	74,905,615	77,131,693
	74,905,615	77,131,693

3.1 වෙනත් ආදායම්	2015	2014
	රු.	රු.
පාසිකුඩා ව්‍යාපෘතියේ ආදායම	10,171,850	9,965,995
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය	83,623,627	1,216,995
පරණ කඩදාසි අලෙවිය	973,929	2,027,708
වෙනත් ආදායම් - වාලච්චේනේ	-	251,281
	94,769,476	13,461,978

4. දේපල, පිරියත සහ උපකරණ

4.1 දළ රැගෙන ආ ප්‍රමාණය	**2014.04.01 වන විට**	**අමතර**	**ප්‍රත්‍යාගණනය**	**බැහැර කිරීම්**	**2015.03.31 වන විට**
	රු.	රු.	රු.	රු.	රු.
වියදමින්					
ඉඩම් සහ ගොඩනැගිලි	132,274,693	-	-	-	132,274,693
ලී බඩු සහ උපාංග	15,715,800	125,000	-	(93,000)	15,747,800
මෝටර් වාහන	26,370,600	-	-	-	26,370,600
යන්ත්‍ර සහ උපකරණ	470,973,374	-	-	-	470,973,374
ක්‍රියාවලීය උපකරණ	87,358,241	-	-	-	87,358,241
පරිගණක	723,140	250,490	-	(31,990)	941,640
උපයෝගීතා	105,417,606	-	-	-	105,417,606
	838,833,455	375,490	-	(124,990)	839,083,955
ප්‍රාග්ධන නොනිමි වැඩ	34,224,272	3,005,650	-	-	37,229,922
	34,224,272	3,005,650	-	-	37,229,922
මුළු දළ රැගෙන ආ ප්‍රමාණය	873,057,727	3,381,140	-	(124,990)	876,313,876

4.2 ක්ෂය	2014.04.01 වන විට	වසර සඳහා අය කිරීම්	බැහැර කිරීම්	2015.03.31 වන විට
	රු.	රු.	රු.	රු.
වියදමින්				
ඉඩම් සහ ගොඩනැගිලි	114,467,971	451,015	-	114,918,987
ගෘහ භාණ්ඩ සහ උපාංග	15,630,925	15,250	(65,100)	15,581,075
මෝටර් වාහන	21,924,439	1,659,598	-	23,584,038
යන්ත්‍ර සහ උපකරණ	438,905,786	2,754,283	-	441,660,069
ක්‍රියාවලීය උපකරණ	86,686,791	2,779	-	86,689,570
පරිගණක	168,562	201,818	(5,323)	365,057
උපයෝගීතා	104,449,413	237,799	-	104,687,212
මුළු ක්ෂය	782,233,888	5,322,543	(70,423)	787,486,008

4.3 ශුද්ධ පොත් අගය	2015	2014
	රු.	රු.
වියදමින්		
ගොඩනැගිලි	17,355,707	17,806,722
ඉඩම් සහ ගොඩනැගිලි	166,725	84,875
ගෘහ භාණ්ඩ සහ උපාංග	2,786,562	4,446,160
මෝටර් වාහන	29,313,305	32,067,588
යන්ත්‍ර සහ උපකරණ	668,672	671,451
ක්‍රියාවලීය උපකරණ	576,583	554,578
පරිගණක	730,394	968,193
උපයෝගීතා	51,597,947	56,599,567
ප්‍රාග්ධන නොනිමි වැඩ	37,229,922	34,224,272
දේපල, පිරියත සහ උපකරණ සඳහා රැගෙන ආ මුළු ප්‍රමාණය	88,827,869	90,823,839

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

4.4 වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත. (සබැඳේ...)

	2015	2014
	රු.	රු.
ඉඩම සහ ගොඩනැගිලි	වසර 40යි	වසර 40යි
ගෘහ භාණ්ඩ සහ උපාංග	වසර 10යි	වසර 10යි
මෝටර් වාහන	වසර 4යි	වසර 4යි
යන්ත්‍ර සහ උපකරණ	වසර 15යි	වසර 15යි
ක්‍රියාවලීය උපකරණ	වසර 15යි	වසර 15යි
පරිගණක	වසර 5යි	වසර 5යි
උපයෝගිතා	වසර 15යි	වසර 15යි

4.5 මූල්‍ය වර්ෂයේ දී සමාගම රු. 3,381,140/-ක සමාහාර වටිනාකමකට (2014 දී රු. 226,300/-කි) දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගෙන ඇත. දේපල, පිරියත සහ උපකරණ මිල දී ගැනීම සඳහා සමාගම වසරේ දී රු. 3,381,140/-ක් (2014 දී 226,300/-ක්) වැය කර ඇත.

5. දිගු කාලීන ආයෝජන	2015	2014
	රු.	රු.
දිගු කාලීන ආයෝජන	(1,964,561)	56,484,145
	(1,964,561)	56,484,145

6. තොග ලේඛනය	2015	2014
	රු.	රු.
අමුද්‍රව්‍ය	14,618,178	13,646,258
නිමි භාණ්ඩ	12,501,450	1,317,417
අමතර කොටස් සහ මෙවලම්	79,523,390	79,328,315
පරිභෝජනය කළ හැකි අයිතම	29,632,874	39,502,646
	136,275,892	133,794,636

7. වෙළෙඳ සහ වෙනත් ලැබීම්	2015	2014
	රු.	රු.
වෙළෙඳ ලැබීම්	58,620,894	37,932,567
වෙනත් ලැබීම් සඳහා වෙන් කිරීම්- වෙනත්	(2,829,234)	(2,829,234)
	55,791,659	35,103,333
වෙනත් ලැබීම්	236,294,238	243,683,627
තැන්පතු සහ කලින් ගෙවීම්	19,449,813	7,612,292
	311,535,710	286,399,252

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය	2015	2014
	රු.	රු.
භාණ්ඩාගාරයෙන් සැපැයූ ප්‍රකාශිත ප්‍රාග්ධනය	323,000,000	323,000,000
	323,000,000	323,000,000

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

9. වෙළෙඳ සහ වෙනත් ගෙවීම්	2015	2014
	රු.	රු.
වෙළෙඳ ගෙවීම් - වෙනත්	150,244,725	106,125,564
වෙනත් ගෙවීම්	1,165,553,796	1,077,234,739
අංශවලට ගෙවීම්	1,073,515	-
	1,316,872,037	1,183,360.303
ව්‍යවස්ථාපිත ගෙවීම්	45,893,185	36,859,158
	1,362,765,222	1,220,219.461
ආණ්ඩුවට ගෙවීම්	100,681,254	88,486,726
	1,463,446,476	1,308,706.187

10. මූල්‍ය ආදායම	2015	2014
	රු.	රු.
ස්ථාවර තැන්පතු මත පොළී ආදායම	4,499,115	7,203,080
	4,499,115	7,203,080

11. මූල්‍ය වියදම	2015	2014
	රු.	රු.
පොළී වියදම	8,705,267	7,377,810
	8,705,267	7,377,810

(සබැඳේ...)

12. පොළී අනුපාත - ධාරක ණය සහ ණය ගැනුම්

	2015 පළමු වසරේ දී ආපසු ගෙවන ප්‍රමාණය	2015 පළමු වසරෙන් පසු ආපසු ගෙවන ප්‍රමාණය	2015 එකතුව	2014 පළමු වසරේ දී ආපසු ගෙවන ප්‍රමාණය	2014 පළමු වසරෙන් පසු ආපසු ගෙවන ප්‍රමාණය	2014 එකතුව	
	රු.	රු.	රු.	රු.	රු.	රු.	
ණය	-	159,590,943	159,590,943	-	160,004,648	160,004,648	
මූල්‍ය කල්බදු	1,973,287	3,124,370	5,097,657	1,395,005	4,599,286	5,994,291	
බැංකු අයිරා (14.2 සටහන)	16,145,030	-	16,145,030	62,396,682	-	62,396,682	18,118,317
	162,715,313	180,833,629	63,791,688	164,603,934	228,395,621		

12.1 ණය

	2014.04.01 වන විට	ලබාගත් ණය	ආපසු ගෙවීම්	2015.03.31 වන විට
	රු.	රු.	රු.	රු.
කේඑෆ්ඩබ්ලිව් ණය	159,654,648	-	-	159,654,648
පරන්තන් කෙමිකල්ස් - ණය	350,000	-	-	350,000
මහජන බැංකුව යූ - 13785	-	8,784,850	(9,175,304)	(390,454)
මහජන බැංකුව යූ - 13794	-	976,095	(999,346)	(23,251)
	160,004,648	9,760,945	(10,174,650)	159,590,943

12.2 මූල්‍ය කල්බදු

	2014.04.01 වන විට	ලබාගත් කල්බදු	ආපසු ගෙවීම්	2015.03.31 වන විට
	රු.	රු.	රු.	රු.
කල්බදු - 8822: එච්සීඑල්ඊඑල්ඊ 1200063800	1,875,646	-	(262,395)	1,613,251
කල්බදු - 8825: එච්සීඑල්ඊඑල්ඊ 1200063700	1,957,753	-	(341,740)	1,616,013
කල්බදු - 8709: එච්සීඑල්ඊඑල්ඊ 1200063600	-	(516,305)	1,868,393	
	6,218,097	-	(1,120,440)	5,097,657

	2015	2014
	රු.	රු.
දළ වගකීම්	6,345,539	8,183,864
අනාගත කාලය සඳහා වෙන් කර ඇති මූල්‍ය ගෙවීම්	(1,247,882)	(1,965,767)
ශුද්ධ වගකීම්	5,097,657	6,218,097

මූල්‍ය ප්‍රකාශයට සටහන්

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

13. මුදල් සහ මුදල්වලට සමාන දේ මුදල් සහ මුදල්වලට සමාන දෙයෙහි අඩංගු දේ වාසිදායක මුදල් සහ මුදල්වලට සමාන දේ ශේෂය	2015 රු.	2014 රු.
13.1 බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් **අවාසිදායක මුදල් සහ මුදල්වලට සමාන දේ ශේෂය**	18,673,610	2,203,853
13.2 බැංකු අයිරාවන් **මුළු මුදල් සහ මුදල්වලට සමාන දෙයෙහි ශේෂය**	(16,145,030) 2,528,580	(62,396,683) (60,192,830)

14. අසම්භාව්‍යතාවන්

14.1 අසම්භාව්‍යතාවන්

15.1 සමාගමට එහි බැඳීම් තෘප්තිමත් කරන්නැයි ඉල්ලමින් එහි සේවකයින් පැවැරූ නෛතික ක්‍රියා මාර්ගයන් කිහිපයක් උසාවියේ විභාග වෙයි. 2015 මාර්තු 31 වැනිදා වන විටත් ඒවායේ ප්‍රතිඵල සමථයකට පත් වී නොතිබුණි. මෙවැනි බැඳීම් සමථයකට පත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග කිසිවක් ගැන මූල්‍ය ප්‍රකාශයේ සඳහන් වී නොමැත.

16. වාර්තාව සිදු කළ දිනට පසු සිදු වූ සිද්ධීන්

මූල්‍ය වාර්තාවේ සඳහන් කළයුතු තරමේ හෝ එහි අනාවරණයන් සිදු කළයුතු මට්ටමේ හෝ එහි ගැළපීම් සිදුකළ යුතු මට්ටමේ සිද්ධියක් වාර්තාව සකස් කළ දිනයෙන් අනතුරුව සිදුවූයේ නැත.

සවිස්තර ලාභ සහ අලාභ ප්‍රකාශය

2015 මාර්තු 31 න් අවසන් වන වසර

සවිස්තර ලාභ සහ අලාභ ප්‍රකාශය

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

I වන ප්‍රකාශය	**2015**	**2014**
විකුණුම් වියදම	**රු.**	**රු.**
ආරම්භක තොගය	3,306,054	3,707,000
වසර තිස්සේ නිෂ්පාදන වියදම	254,007,898	258,227,330
පියවුම් තොගය	(14,195,701)	(3,306,054)
විකුණුම් වියදම	243,118,251	258,628,276

II වන ප්‍රකාශය	**2015**	**2014**
මූල්‍ය වියදම	**රු.**	**රු.**
බැංකු වියදම්	261,179	195,299
කල්බදු පැහැර හැරීමේ පොලිය	-	36,529
කල්බදු පොලිය	1,579,219	5,713,753
භාර ණය සහ අයිරා ගැනුම් මත පොලිය	6,864,870	1,432,229
	8,705,267	7,377,810

III වන ප්‍රකාශය	**2015**	**2014**
වෙනත් වියදම්	**රු.**	**රු.**
වත්කම් බැහැර කිරීමේ අලාභ	8,572	-
නෛතික ගාස්තු	96,500	131,500
ප්‍රවාහන ගාස්තු	229,000	431,000
	334,072	562,500

සවිස්තර ලාභාලාභ ප්‍රකාශය

2015 මාර්තු 31 වැනිදායින් අවසන් වන වසර

IV වන ප්‍රකාශය	2015	2014
පරිපාලන වියදම	**රු.**	**රු.**
කාර්ය මණ්ඩල වැටුප් සහ ප්‍රසාද මුදල්	20,787,907	19,520,723
ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ -සේඅඅ සහ සේභාඅ	2,640,426	2,456,849
- පාරිතෝෂික	-	95,024
බදු සහ පොලී	3,756,229	3,378,918
කාර්ය මණ්ඩල සුබසාධනය	1,454,021	884,995
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල දීමනා	1,440,467	949,276
දුරකථන, ෆැක්ස්, කුරියර් සහ තැපැල් ගාස්තු	1,201,898	826,314
වාහන කුලී	1,035,000	47,500
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	571,424	710,757
අලුත්වැඩියා සහ නඩත්තු	456,712	175,412
විගණන වියදම	-	77,000
නෛතික සහ වෘත්තීය ගාස්තු	239,270	349,500
පුණ්‍ය පරිත්‍යාග	252,833	6,600
ක්ෂය	229,950	131,781
රක්ෂණය	-	233,676
බලශක්තිය සහ විදුලිබලය	383,113	225,880
ජලය	118,532	103,949
ලේකම් කටයුතු පිළිබඳ වියදම්	2,240	425,000
අවදානම් දීමනාව	-	12,000
පොදු වියදම්	75,830	13,078
හිඟ දඩ මුදල්	7,686	-
	34,653,539	30,624,230

V වන ප්‍රකාශය	2015	2014
විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්	**රු.**	**රු.**
අලුත්වැඩියා සහ නඩත්තු - වාහන	2,852,571	478,605
වාහන සඳහා ක්ෂය	1,659,598	361,330
ව්‍යාපාර ප්‍රවර්ධන	1,068,304	400,397
ගමන් වියදම් සහ යැපීම්	876,628	2,820,904
ප්‍රදර්ශන වියදම්	595,440	-
විනෝදාස්වාද වියදම්	418,792	770,963
දැන්වීම්කරණ වියදම්	300,595	1,659,598
ඡායාපිටපත් කඩදාසි අලෙවිකරණ වියදම්	7,451	714,340
ගෙන යාමේ කුලී සහ ප්‍රවාහන වියදම්	-	50,000
	7,779,378	7,256,138

VI වන ප්‍රකාශය	2015	2014
වෙනත් මෙහෙයුම් වියදම්	රු.	රු.
පරණ කඩදාසි සම්බන්ධ වියදම්	3,222,458	2,574,498
	3,222,458	2,574,498



National Paper Company Limited
No: 61, Stratford Avenue, Colombo 05